ස්වදේශ කටයුතු චක්‍රලේඛ - 04/2023 (I)

මගේ අංකය : HA/02/26/03/10
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.
"නිල මැදුර",
ඇල්විටිගල මාවත,
කොළඹ 05.
2023.02.15

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම - 2022

2022 අංක 24 දරණ සුබසාධන ප්‍රතිලාභ පනතේ විධිවිධාන ප්‍රකාරව සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම - 2022 වැඩසටහන සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 04/2023 හි සඳහන් කරුණුවලට වැඩිමනක් වශයෙනි.

02. ඒ අනුව, උක්ත චක්‍රලේඛයෙහි 02 ඡේදයේ සඳහන් පරිදි අයදුම්කරුවන්ගේ ප්‍රකාශ ලබා ගැනීමේදී, එම කාර්යය පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කරන, වගකීමක් දැරිය හැකි, අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් (සම්මාන 03ක් සමඟ විෂයන් 06ක් සමත්) යෞවන සමාජ හා ක්‍රීඩා සමාජ වැනි සංවිධානවල සාමාජිකයින්, විශ්‍රාමික රජයේ නිලධාරීන් හෝ වෙනත් ඕනෑම අයෙකු සම්බන්ධ කර ගනිමින් එම කටයුත්ත විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.

03. තවද, ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 04/2023 හි 03 ඡේදයේ IV වගන්තිය පරිදි අයදුම්කරුවන්ගේ ප්‍රකාශ ලබා ගැනීම වෙනුවෙන් එක් අයදුම්පතක් සඳහා රු.300.00 බැගින් වූ දීමනාවක් ලබාදෙනු ලැබේ.

04. එසේම, මෙම කාර්යය 2023.03.31 දින වන විට නිම කළ යුතු බැවින් තෝරා ගන්නා ලද නිලධාරීන් වෙත මෙම කාර්යය පැවරීම සඳහා පත්වීම් ලිපියක් අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් නියමිත කාල සීමාවට වලංගු වන පරිදි ලබා දිය යුතු අතර, ඒ සඳහා ආදර්ශයක් ඇමුණුම 01 හි දක්වා ඇත.

05. මෙම තෝරා ගැනීම් හා අයදුම්කරුවන්ගේ ප්‍රකාශ ලබා ගැනීම කඩිනමින් සිදු කළ යුතු අතර, උක්ත වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමි.

ජී් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
දුරකථන : +94 11 2050363
ෆැක්ස් : +94 11 2369832
විද්‍යුත් ලිපිනය : diviadmin@moha.gov.lk

ඇමුණුම 01

............................ මයා/ මිය
..................................
..................................

මහත්මයාණෙනි/මහත්මියණි,

<u>.................................ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනාගැනීම සඳහා සේවයේ යොදවා ගැනීම</u>

ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 04/2023 (1) අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ..........................ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනාගැනීමට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා .................... දින සිට 2023.03.31 දින දක්වා ඔබව සේවයේ නිරත කරවනු ලැබේ.

02. මෙම කාර්යය ඉටු කිරීමට අදාළව ඔබ වෙත ලබා දෙනු ලබන යෙදවුම (Mobile Application) භාවිතයෙන්, දී ඇති උපදෙස් ප්‍රකාරව අයදුම්කරුවන්ගෙන් තොරතුරු සහ ප්‍රකාශ ලබා ගැනීම වෙනුවෙන් එක් අයදුම්පතක ට රුපියල් 300.00 ක දීමනාවක් ගෙවනු ලැබේ. මේ සඳහා වෙනත් අමතර දීමනා කිසිවක් ලබා ගැනීමට ඔබට හිමිකමක් නොමැත. තොරතුරු එකතු කිරීම සඳහා ඔබගේ පුද්ගලික ජංගම දුරකථනය සහ අන්තර්ජාල සබඳතාවය භාවිතා කළ යුතුය.

03. මෙම ලිපිය ලද වහාම තමන් සේවය සඳහා එකඟ වන බව සනාථ කෙරෙන ලිපියක් ඔබ විසින් ලබා දිය යුතුය. එම දිනයේදීම පහත සඳහන් ලිපි ලේඛන භාර දීමට ක්‍රියා කළ යුතුය.

i. ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපතක්;

ii.ඔබගේ තනතුරට අවශ්‍ය කරන මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන අධ්‍යාපන සහතික වල මුල් ලේඛන හා සහතික කල ඡායාපිටපත් (පරීක්ෂා කිරීමෙන් අනතුරුව මුල් ලේඛන ආපසු භාර දෙනු ඇත.)

iii. පොදු 160 ආකෘතිපත්‍රය ප්‍රකාර සේවා ගිවිසුම

iv. ස්ථිර හා තාවකාලික ලිපිනය

04. මෙහිදී ඔබ විසින් සාවද්‍ය හෝ ව්‍යාජ තොරතුරු සපයා ඇති බව, ඔබ සේවය ලබා දෙන අතරතුර කුමන අවස්ථාවකදී හෝ විධිමත්ව තහවුරු වුවහොත්, ඔබගේ සේවය අත්හිටුවීමට කටයුතු කරන අතර කිසිදු ගෙවීමක් සිදු නොකෙරේ.

05. ඔබ විසින් මෙම කාර්යය නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කරනු ඇති බලාපොරොත්තු වෙමි. මෙම ලිපිය සේවාව ලබා ගැනීම සඳහා පමණක් වලංගු වන අතර, වෙනත් අයිතිවාසිකමක් ලබා ගැනීමට භාවිතා කල නොහැක.

ප්‍රාදේශීය ලේකම්
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
..............................